Liberté • Égalité • Fraternité
RÉPUBLIQUE FRANÇAISE
MINISTÈRE DE LA JUSTICE

5

# අයිතීන් පිළිබඳ ප්‍රකාශනය

## පොලිස් අත්අඩංගුවේ පසු වන අයකුට හිමි විය යුතු සහන

**(වයස අවුරුදු 13 සිට 18 දක්වා වන බාලවයස්කරුවන් - සාමාන්‍ය කාර්යය පටිපාටිය)**

**පහත සඳහන් තොරතුරු තමා හට ලබා දිය යුතු වන්නේ තමාට තේරුම් ගත හැකි භාෂාවකින් ය.**

***<u>පොලිස් අත්අඩංගුවේ පසු වන සම්පූර්ණ කාලය තුළ තමාට මෙම ලේඛනය තමා සන්තකයේ තබා ගත හැක</u>***

තමා හට දන්වා සිටින්නේ තමා පොලිස් අත්අඩංගුවේ පසු වන්නේ සිර දඬුවමකින් දඬුවම් ලැබිය හැකි වරදකාරී ක්‍රියාවක් සිදු කිරීම හෝ සිදු කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් සැක කළ හැකි විශ්වාස කටයුතු කරුණක් හෝ කරුණු තමාට එරෙහි ව ඇති නිසා ය.

ඔබ හට චෝදනා නගා ඇති වරදකාරී ක්‍රියාව සිදු කරන ලදැයි නිගමනය කර ඇති දිනය, ස්ථානය සහ ඊට අදාළ සීමා සම්බන්ධයෙන් ද පොලිස් අත්අඩංගුවට ගැනීම සාධාරණීකරණය කළ හැකි හේතු දැන ගැනීමට ද ඔබට අයිතියක් ඇත.

පැය 24 ක කාලයක් පුරා දිවෙන පොලිස් අත්අඩංගුව අතරතුර මෙකී ක්‍රියා පිළිබඳ ව ඔබගෙන් ප්‍රශ්න කෙරෙනු ඇත. මෙකී කාල සීමාව අවසානයේ දී, මහජන පැමිණිලිකරු විසින් (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයා හෝ කුඩා දරුවන් සම්බන්ධ විනිසුරුවරයා විසින්) තවත් අතිරේක පැය 24 ක කාල සීමාවකට පොලිස් අත්අඩංගුව දීර්ඝ කිරීමට තීරණය කළ හැක. කෙසේ වෙතත් ඔබ වයස අවුරුදු 16 ට අඩු නම්, දීර්ඝ කිරීමක් සිදු කළ හැකි වන්නේ අවුරුදු 5 ක් හෝ ඊට වැඩි සිර දඬුවමකින් දඬුවම් ලැබිය යුතු වරදක් සම්බන්ධයෙන් ඔබ සැකකාරයකු වන්නේ නම් පමණකි. එසේ කිරීමට අපහසු අවස්ථාවන් හි දී අත්‍යවශ්‍ය වේ නම් වීඩියෝ දුරකථන සංවාද ජාල හරහා තමුන් ව මහේස්ත්‍රාත්වරයා වෙත පමුණුවනු ඇත.

පොලිස් අත්අඩංගුව අවසානයේ මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයාගේ හෝ කුඩා දරුවන් සම්බන්ධ විනිසුරුවරයා විසින්) ගේ තීරණය මත මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීම හෝ මුදා හැරීම සිදු කළ හැක. ඔබ විසින් අත්අඩංගුවේ පසු වන කාලය ඉක්ම ගොස් පැය 20 කට නොඅඩු කාලයක් තුළ දී ඔබ ව විනිසුරුවරයකු ඉදිරියට මුල් වරට පැමිණවිය යුතු වන්නේ ය.

**ඔබ හට තවදුරටත් දන්වා සිටින්නේ ඔබ හට ඇති අයිතීන් අතරේ:**

### යම් පුද්ගලයන් හට දැනුම් දීම

ඔබ ව පොලිස් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් යම් නිලධාරියකු හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඒජන්තයකු හෝ විසින් ඔබගේ දෙමාපියන්ට හෝ ඔබගේ භාරකරුට හෝ ඔබ ව භාර ව සිටින යම් පුද්ගලයකු හෝ යම් සේවයකට දැනුම් දෙනු ඇත.

එසේ ම ඔබට ඔබගේ සේවා යෝජකයාට දැන්වීමට ද හැකියාව ඇත.

ඔබ විදේශීය ජාතිකයකු නම් තවදුරටත් ඔබට ඔබගේ රටේ තානාපති අංශ වෙත දැනුම් දීමේ හැකියාව ඇත.
කෙසේ වෙතත් සිදු කරනු ලබන පරීක්ෂණ වල අවශ්‍යතාව සළකා බලා මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයා හෝ කුඩා දරුවන් සම්බන්ධ විනිසුරුවරයා විසින්) එකී ඉල්ලීම් වලට විරුද්ධ විය හැක. නොවැලැක්විය හැකි තත්ත්වයන් යටතේ හැර ඔබගේ ඉල්ලීම සිදු කර උපරිම වශයෙන් පැය 3 ක කාලයක් තුළ ඉතා කඩිනමින් එකී ඉල්ලීම ඉටු කළ යුතු වේ.

### වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කරවා ගැනීම

ඔබට වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කරවා ගැනීම සඳහා ඉල්ලීමක් කළ හැකි ය. අත්අඩංගුවේ පසු වන කාලය දීර්ඝ කිරීමක දී වෛද්‍යවරයකු ලවා නැවත වතාවක් පරීක්ෂා කර ගැනීම සඳහා ඉල්ලීමක් ඔබ හට කළ හැකි ය. මෙම ඉල්ලීම් ඔබගේ දෙමාපියන්, ඔබගේ භාරකරු හෝ ඔබ ව භාර ව සිටින යම් පුද්ගලයකු හෝ ආයතනයක් විසින් ඒ ආකාරයෙන් ම සිදු කළ හැක.

කෙසේ වෙතත් ඔබ වයස අවුරුදු 16 ට වඩා අඩු පුද්ගලයකු නම්, මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරන

විනිසුරුතුමා හෝ කුඩා දරුවන් හා සම්බන්ධ විනිසුරු විසින්) ඔබ ව පරීක්ෂා කිරීම සඳහා වෛද්‍යවරයකු තෝරා පත් කරනු ඇත.

**ප්‍රකාශ ලබා දීම, ප්‍රශ්න කිරීම් වලට උත්තර දීම හෝ නිහඬ ව සිටීම**

ඔබගේ අනන්‍යතාව ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව වන පරීක්ෂණ අතරතුර ඔබට ඇති අයිතීන් නම්:
- ප්‍රකාශ සිදු කිරීම.
- ඔබගෙන් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම.
- හෝ නිහඬ ව සිටීම සිදු කළ හැක.

**නීතිඥවරයකුගේ සහය ලැබීමට**

- **නීතිඥයකු තෝරා ගැනීම**

අත්අඩංගුවට පත් මුල් අවස්ථාවේ දී සහ අත්අඩංගුව දීර්ඝ කිරීමක දී, එකී දීර්ඝ කිරීම සිදු කරන මුල් අවස්ථාවේ දී ඔබ විසින් තෝරා ගන්නා ලද නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීමට ඉල්ලීමක් කිරීමට ඔබට හැකි ය. ඔබ හට නීතිඥවරයකු පත් කර ගැනීමට හැකියාවක් නොමැත්තේ නම් හෝ තෝරා ගත් නීතිඥවරයා සම්බන්ධ කරගත නොහැකි නම් පත් කළ නීතිඥයකුගේ සහාය සඳහා ඉල්ලීමක් කිරීමට ඔබට හැකි ය.

ඔබගේ නීතිඥවරයා තෝරා පත්කර ගැනීම ඔබගේ දෙමාපියන්ට හෝ ඔබේ භාරකරුට හෝ ඔබ භාර ව සිටින පුද්ගලයකුට හෝ සේවයකට ද සිදු කළ හැක.

- **නීතිඥ සහාය සහ මැදිහත් වීමට ඇති සීමා**

නීතිඥවරයාට ඇති හැකියාවන් අතර:
- සිදු කරනු ලබන සාකච්ඡාවේ රහස්‍යභාවය සුරක්ෂිත කරමින් පුරා විනාඩි 30 ක කාලයක් ඔබ සමග සාකච්ඡාවේ යෙදීමට. ඔබ විසින් ඉල්ලීමක් සිදු කරන්නේ නම් ඔබ සම්බන්ධයෙන් සිදු කරන විභාග කිරීම් වල දී සහ ප්‍රශ්න කිරීම් වල දී සහාය ලබා ගැනීම

තව ද ඔබගේ පළමු ප්‍රශ්න කිරීම, ඔබගේ අනන්‍යතාව සම්බන්ධ කරුණු පිළිබඳ ව පමණක් වන්නේ නම් හැර, ආරම්භ කිරීම ඉදිරි පැය 2 ක කාලයක් සඳහා ඔබගේ නීතිඥවරයා නොමැති ව කළ නොහැක්කේ නම් ඒ බව දන්වා ඉල්ලීමක් කළ හැක.

කෙසේ වෙතත්, පරීක්ෂණයේ අවශ්‍යතාව මත මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයාගේ අනුමැතිය හෝ කුඩා දරුවන් හා සම්බන්ධ විනිසුරු විසින්) ඔබගේ පළමු ප්‍රශ්න කිරීම ඔබගේ නීතිඥවරයා නොමැති ව වුව ද නොපමා ව ආරම්භ කළ හැකි වන්නේ ය.

විභාගයක් හෝ පරීක්ෂණයක් සිදු කරමින් පවතින අතරතුර ඔබගේ නීතිඥයා පැමිණියහොත් ඔහු සමඟ සාකච්ඡා කිරීමට ඉඩ දී, එකී කාර්යය ඔබේ ඉල්ලීම මත තාවකාලික ව නවතා දැමීමට හැකි ය.

ඔබ විසින් චෝදනා ලැබ සිටින වරද අවමය අවුරුදු 5 ක් වන සිර දඬුවමක් නම්, මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයා හෝ කුඩා දරුවන් හා සම්බන්ධ විනිසුරු විසින්) සහ සිවිල් අයිතීන් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ විනිශ්චයකරුවකුට, වරකට පැය 12 ක කාලයක් පුරාවට සහ එක් වරක් දීර්ඝ කිරීමකට යටත් ව, විශේෂිත හේතු කාරණා මත, ප්‍රශ්න කිරීම් අතරතුර දී ඔබ හට නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීම වැළැක්වීමට තීරණය කළ හැක්කේය.

**භාෂා පරිවර්තකයකුගේ සහාය ලබා ගැනීම**

ඔබට ප්‍රංශ භාෂාව කථා කළ නොහැකි නම් හෝ තේරුම්ගත නොහැකි නම් ඔබ හට කිසිදු ගාස්තුවක් නොමැති ව, ඔබගේ ප්‍රශ්න කිරීම අතරතුර සහ ඔබගේ නීතිඥවරයා සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාෂා පරිවර්තකයකුගේ සහාය පැතීමට අයිතිය ඇත.

**පොලිස් අත්අඩංගුව අවසන් කරන මෙන් ඉල්ලීමක් කිරීමට ඇති අයිතිය**

මෙම මහේස්ත්‍රාත්වරයා විසින් ඉදිරි අවස්ථාවක දී නියම කරනු ලබන අත්අඩංගුවේ රඳවා තබා ගැනීම දිගු කිරීමක දී එකී දිගු කිරීම සිදු නොකරන ලෙසට මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්ගෙන් හෝ කුඩා දරුවන් හා සම්බන්ධ විනිසුරු විසින්) ඉල්ලීමක් කිරීමට හැක.

**ඔබගේ නඩු ගොනුවේ ඇති ඇතැම් ලේඛන වලට ඇති ප්‍රවේශය**

ඔබගේ ඉල්ලීම මත හෝ ඔබගේ නීතිඥවරයාගේ ඉල්ලීම මත, වෙනත් අවස්ථාවක දී ඔබගේ අත්අඩංගුවේ රඳවා තබා ගැනීම දීර්ඝ කිරීමකට පෙර පහත දෑ පිරික්සීමට ඔබට හැක:
- ඔබගේ අත්අඩංගුවට ගැනීම දැනුම් දීමට අදාළ කාර්යය සටහන්
- ඔබව පරීක්ෂා කරන ලද වෛද්‍යවරයා විසින් සපයන ලද වාර්තාව හෝ වාර්තා
- ඔබගේ ප්‍රශ්න කිරීම් හා සම්බන්ධ කාර්යය සටහන්

**නීති කෘත්‍යයන්හි ඊළඟ පියවර පිළිබඳ දැනුවත් වීම**

අත්අඩංගුව අවසානයේ, මහජන පැමිණිලිකරු විසින් නීති කෘත්‍යයන්හි අනෙකුත් පියවර පිළිබඳ කිසිදු තීරණයක් ගෙන නොමැත්තේ නම්, එයින් මාස 6 ක් ඉක්මවීමට පෙර, මෙකී කාරණාව සම්බන්ධයෙන් මහජන පැමිණිලිකරු විසින් ගනු ලබන ක්‍රියා මාර්ග පිළිබඳ ව විමසීමක් කිරීමට ඔබට හැක.